*සැ. යු.*- 2018.10.05 දින පළ වූ අංක 2,092 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,093 - 2018 ඔක්තෝබර් මස 12 වැනි සිකුරාදා - 2018.10.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 688 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 නොවැම්බර් මස 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ඔක්තෝබර් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

687-B 081457— 353 (2018/10)
D 1 -

# විවිධ දැන්වීම්

## 1986 අංක 28 දරන ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

විජේපාල හෙට්ටිආරච්චි වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53 යටතේ 1986 අංක 28 දරන ''ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

2. පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ එහි සංස්ථාගත නාමය වන ''ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ)'' වෙනුවට ''ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306ඒ$^{1}$ - දිස්ත්‍රික්ක 306ඒ$^{2}$ ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ)'' ලෙස සංශෝධනය කර භාවිතා කිරීමයි.

විජේපාල හෙට්ටිආරච්චි,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

10-270

## සුබය්ර් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

රෝහිනී කුමාරි විජේරත්න වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 දරන ස්ථාවර නියෝගය යටතේ ''සුබය්ර් පදනම'' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි.

1. දුප්පතුන් සඳහා වාසස්ථාන සැපයීම,
2. ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා ආධාර ලබාදීම,
3. රැකියා නොමැති අයට ස්වයං රැකියා අවස්ථා ලබාදීම ;

යනාදිය වේ.

රෝහිනී කුමාරි විජේරත්න,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

10-271

---

## ග්ලෝබල් බිස් ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ඥානමුත්තු ශ්‍රීනේෂන් වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 53 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ 'ග්ලෝබල් බිස් ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ග්ලෝබල් බිස් ආයතනය සංස්ථාගත කිරීමයි.

*(අ)* රට තුළ හා විදේශයන්හි ජීවත්වන විවිධ ජනවාර්ගික ප්‍රජාවන් අතර වාර්ගික සංහිඳියාවක් ඇති කිරීම සඳහා කටයුතු කිරීම සහ ඇති කිරීම;

*(ආ)* ළමුන්, තරුණයින් සහ වැඩිහිටියන් අතර අධ්‍යාපන සහ වෘත්තීය පුහුණුව, කුසලතා සංවර්ධන පුහුණුව, නායකත්ව පුහුණුව වැඩිදියුණු කිරීම;

*(ඇ)* ස්වාභාවික විපත් සහ සිවිල් ගැටුම් ඇති වූ විට අවතැන්වූවන් සඳහා සහන හා පුනරුත්ථාපන කටයුතු හඳුනා ගැනීම, ආධාර කිරීම හා ක්‍රියාත්මක කිරීම;

යනාදිය වෙයි.

ඥානමුත්තු ශ්‍රීනේෂන්,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
මඩකලපුව දිස්ත්‍රික්කය.

10-345

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.